[අන්තර්ජාල අනුවාදයකි.]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 39 දරන මෛත්‍රීය බුද්ධ ධර්මදූත පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5. 75 තැපැල් ගාස්තුව: රු. 3.50

## 1999 අංක 39 දරන මෛත්‍රිය බුද්ධ ධර්මදූත පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වැනි දින.]

එල්. ඩී. - ඕ. 48/97.

**මෛත්‍රිය බුද්ධ ධර්මදූත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මෛත්‍රීය බුද්ධ ධර්මදූත පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව පදනමේ පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද, (පූර්විකාව.)

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්වා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1999 අංක 39 දරන මෛත්‍රීය බුද්ධ ධර්මදූත පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මෛත්‍රීය බුද්ධ ධර්මදූත පදනම දැනට සාමාජිකයන්වී සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මෛත්‍රීය බුද්ධ ධර්මදූත පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. (මෛත්‍රී බුද්ධ ධර්මදූත පදනම සංස්ථාගත කිරීම.)

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :- (සංස්ථාවේ පොදු පරමාර්ථ.)

(අ) ශ්‍රී ලංකාව තුළ පොදුවේ බුද්ධ ධර්මයට අදාළ අධ්‍යාත්මික හා සංස්කෘතික වත්පිළිවෙත් සහ ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම ;

(ආ) පුද- පූජා පැවැත්වීම මගින් බුද්ධ ධර්මය ප්‍රචලිත කිරීම සහ අදාළ වත්පිළිවෙත් මගින් මෛත්‍රීය ත්‍රී- රත්නය පැතිරවීම ;

(ඇ) බුද්ධ ධර්ම ප්‍රචාරය තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ආර්ථික සහ සාමාජීය වර්ධනයන් ඇති කිරීම සහ බුද්ධ ධර්ම ප්‍රචාරය තුළින් උත්තම ජීවිතයක් ලභා කිරීම ;

(ඈ) දරිද්‍රතාවයෙන් පෙළෙන දරුවන්ට මූල්‍ය ආධාර සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ පුස්තකාල හා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම ඇතුළුව, දැනුම සහ අධ්‍යාපනය උසස් කර ගැනීමට උපකාරිවන පරිදි වෙනත් ආකාරයකින් මුදල් හෝ වෙනත් ආධාර ලබාදීම ;

(ඉ) සංස්ථාවේ පර්මාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් විදේශීය හෝ දේශීය වෙනයම් ආයතනයක් හෝ සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියාකිරීම හෝ ඒකාබද්ධ වීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ ඉන් බැහැරව සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩුමළු සහ සමූහ අධ්‍යයන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වා ගෙන යාම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම ;

(ඌ) තරුණ පිරිස්වලට රැකියා සලසාදීමේ අරමුණෙන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ පුහුණු පාඨමාලා පවත්වා ගෙන යාම ;

(එ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය වන ආනුෂංගික හෝ හිතකර වන යම් ක්‍රියාවන්, කර්තව්‍ය සහ දේ ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම සහ ලබාගැනීමේ ද, ආධාර මුදල් හෝ පරිත්‍යාග භාර ගැනීමේ හා එකතු කිරීමේ ද, ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ

පරමාර්ථ ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් අස් කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා. කාරණා සහ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු ඒ සඳහා තෝරා පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පළමු කළමනාකරණ මණ්ඩලය මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දන්නාවූ ද, මෙහි උපලේඛනයේ දක්වා ඇත්තා වූ ද, පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ද, කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ද, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ලැබූ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක් දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට අලුතෙන් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සෑම සාමාජිකයෙක් ම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

(3) සංස්ථාවේ මින් මතු සම්මත කරගනු ලබන කිසිම රීතියක් සංස්ථාවේ මහ සභා රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයකින් මිස වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකරනු ලැබිය යුතු ය.

එසේ වුවද, එවැනි යම් වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනය කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලද්දේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බලපැවැත්වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

7. (1) සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාවේ ආදායම හා වියදම පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) ත්‍යාග, පරිත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරීම්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ නමින් සංස්ථවේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන රජයේ බැංකු එකක් හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් ඇති කරනු ලැබිය හැකි ය.

සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

8. (1) සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විලස සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, සංස්ථාවේ වාසි, ලාභ හෝ ලාභාංශ කිසිවක් වේ නම්, ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය.

(2) සංස්ථාව විසුරුවා හරිනු ලබන විටක සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවනු ලැබීමෙන් පසුව ඉතිරි වන සියලු වත්කම් හුදෙක් පුණ්‍ය, ආගමික හෝ සංස්කෘතික කටයුතු සඳහාම පිහිටුවනු ලැබ ඇති හෝ සංවිධාන කරනු ලැබ ඇති යම් අරමුදලක හෝ සංවිධානයක යහපත සඳහාම පමණක් පවරා දෙනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්ථවරණ, පැවරීම්, ත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

10. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතුව තිබූ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් සහ පරිත්‍යාග මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවියයුතු සහ පදනමට අයවිය යුතු ණය.

11. යමක් මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන කවර හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට, දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව තිබෙන අතර ඒ සියලු දේපළ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

12. සංස්ථාවේ මුද්‍රාව, සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස කවරවූ හෝ සාධක පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සනක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. මෙම පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක් හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ ඇති නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය (5(2) වගන්තිය)

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති : | ෂාවෝ, යූ චුං |
| විධායක අධ්‍යක්ෂ : | එදිරිවීර ප්‍රේමරත්න මහතා |
| අධ්‍යක්ෂවරු : | කං, හෝ- ලින්<br>fපං ක්වං-චිං<br>ටිසෙං, ටි-ලයි<br>ලින්, ෂාන් - ටෙ<br>වෙම්, fපු - ෂෞ<br>පූජ්‍ය හල්වතුරේ අස්සජී හිමි<br>පූජ්‍ය කිතලගම පියතිස්ස හිමි<br>කුඹුරුගමුමේ මහානාග හිමි<br>සුනිල් උබේසිරි මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.